# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2480/02 - 2026 මාර්තු මස 16 වැනි සඳුදා - 2026.03.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන නිවේදන

### කල්පිටිය ප්‍රාදේශීය සභාව

ප්‍රාදේශීය සභා සීමාව තුළ වාහන නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

261 වන අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ (I) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව කල්පිටිය ප්‍රාදේශීය සභාව විසින් 2026.02.10 වන දින පවත්වන ලද මහ සභා රැස්වීමේදී අංක 07/2026/02/11/16 තීරණය යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

**ඒ. එස්. එම්. රික්කාස්,**
සභාපති,
කල්පිටිය ප්‍රාදේශීය සභාව.

2026 පෙබරවාරි මස 23 වැනි දින,
කල්පිටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (I) වන උප වගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වන අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (2) වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ වයඹ පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර වයඹ පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2010.07.16 වැනි දින අංක 1663 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ IV (අ) කොටසේ පළ කරනු ලැබූ නිවේදනයේ ප්‍රකාශයට පත් කරන ලද්දා වූ ප්‍රාදේශීය සභා සීමාව තුළ වාහන නවතා තැබීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථාව කල්පිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අදාළ වන පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍ර අංක 1843 හා 2013.12.27 දිනැති ගැසට් නිවේදනය මගින් වැළඳගන්නා ලද අතර, උක්ත සම්මත අතුරු ව්‍යවස්ථාවේ 17 වන වගන්තිය අනුව ක්‍රියාත්මක වීම සඳහා මහ සභා තීරණ අංක 07/2026/02/11/16 යටතේ 2026.02.10 වන දින කල්පිටිය ප්‍රාදේශීය සභා මහ සභාව විසින් ගන්නා ලද තීරණයට අනුව බල ප්‍රදේශය තුළ ත්‍රී රෝද රථ නවතා තැබිය යුතු ස්ථාන සහ එකී එක් එක් ස්ථානයේ නවතා තැබිය යුතු උපරිම ත්‍රී රෝද රථ සංඛ්‍යාව පහත සඳහන් අංක 01 උපලේඛනය පරිදි විය යුතු බවට කල්පිටිය ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.


1A - PG 7574 — 04 (2026/03)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*උපලේඛනය 01*

**ත්‍රී රෝද රථ නවතා තැබීමට යෝජිත ස්ථාන**

| *අනු අංකය* | *ත්‍රී රෝද රථ නැවතුම් ස්ථාන* | *ගාල් කළ හැකි උපරිම ත්‍රී රෝද රථ ගණන* |
|---|---|---|
| 1 | කල්පිටිය ප්‍රාදේශීය සභාව ඉදිරිපිට | 10 |
| 2 | කල්පිටිය ලංකා බැංකුව ඉදිරිපිට | 05 |
| 3 | කල්පිටිය පැරණි වෙළඳ සංකීර්ණය ඉදිරිපිට | 10 |
| 4 | කල්පිටිය බස්නැවතුම්පොළ ඉදිරිපිට | 08 |
| 5 | තොරයඩිය තොටුපොළ ඉදිරිපිට | 10 |
| 6 | කුරිඤ්ඤම්පිටිය මංසන්ධිය | 15 |
| 7 | කන්දකුලිය මුනේ කතෝලික ප්‍රතිමාව අසළ | 15 |
| 8 | පල්ලිවාසල්තුරේ අංක 01 තැපැල් කාර්යාලය ඉදිරිපිට | 10 |
| 9 | පල්ලිවාසල්තුරේ තකාා මුස්ලිම් දේවස්ථානය ඉදිරිපිට | 08 |
| 10 | කන්දකුඩාව අංක 01 ඉන්ධන පිරවුම් හල අසළ | 10 |
| 11 | කන්දකුඩාව අංක 02 කන්දකුඩාව මුස්ලිම් පාසැල් මංසන්ධිය | 10 |
| 12 | මුදලප්පාලිය කියවීම් ශාලාව අසළ | 10 |
| 13 | පාලකුඩාව ගොවිජන සේවා මධ්‍යස්ථානය අසළ | 20 |
| 14 | තලවිල අංක 01 තැපැල් කාර්යාලය ඉදිරිපිට | 10 |
| 15 | තලවිල අංක 02 රංජන් මහතාගේ කඩය අසළ | 10 |
| 16 | ඒත්තාල ඉන්ධන පිරවුම් හල අසළ | 10 |
| 17 | අලංකුඩාව හන්දිය මුස්ලිම් පල්ලිය ඉදිරිපිට | 08 |
| 18 | කොයියාවාඩිය හන්දිය දොස්තර වත්ත ඉදිරිපිට | 08 |
| 19 | නොරච්චෝල අංක 01 ඉලන්තඩිය ගම්මානයට යන මාර්ගය අසළ | 08 |
| 20 | නොරච්චෝල අංක 02 නොරච්චෝල ආර්ථික මධ්‍යස්ථානය අසළ | 06 |
| 21 | ඉලන්තඩිය සිංහල විද්‍යාල ඉදිරිපිට | 05 |
| 22 | පුලච්චේන මංසන්ධියේ බස් නැවතුම්පොළ අසළ | 10 |
| 23 | පනයඩිය මංසන්ධියේ බස් නැවතුම්පොළ අසළ | 08 |
| 24 | මාම්පුරිය මංසන්ධියේ කතෝලික දේවස්ථානය ඉදිරිපිට | 15 |
| 25 | දළුව සිංහල විද්‍යාල ඉදිරිපිට | 15 |
| 26 | සේතපොළ මංසන්ධිය කතෝලික ප්‍රතිමාව අසළ | 05 |
| 27 | කරඹ ඇහලුම් කම්හල ඉදිරිපිට | 05 |
| 28 | කරඹ ගුවන් SLBC ශාඛාව ඉදිරිපිට | 08 |
| 29 | කරඹ මංසන්ධිය පුලුදිවයල් ග්‍රාමයට යන මාර්ගයේ ආරම්භය | 06 |
| 30 | උලුක්කාපල්ලම මුස්ලිම් විද්‍යාල ඉදිරිපිට | 13 |
| 31 | කඩයාමොට්ට මංසන්ධිය මුස්ලිම් දේවස්ථානය ඉදිරිපිට | 09 |
| 32 | කොත්තන්තිව් මංසන්ධියේ නස්මින් මහතාගේ කඩය ඉදිරිපිට | 11 |
| 33 | මුක්කුතොඩුවාව මංසන්ධිය | 19 |






ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.